
# *4.2.2 (සයිමන් නවගත්තේගම)*



**උපත:-** සැප්තැම්බර් 15, 1940 ,ආණමඩුව, ශ්‍රී ලංකාව

**විපත:-** නොවැම්බර් 9, 2005 (වයස 65)

**අධ්‍යාපනය:-** නවගත්තේගම මහා විදුහලෙන්, මහව විජයබාහු මධ්‍ය මහා විදුහලෙන්, අනුරාධපුර මැදි විදුහලෙන් අධ්‍යාපනය ලැබීය. පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදි අපාධියත්, බ්‍රිතාන්‍ය වේල්ස් සරසවියෙන් ප්‍රජා සංවර්ධනය පශ්චාත් උපාධියත්, නැගෙනහිර ජර්මනියෙන් නාට්‍ය කලාව පිළිබඳ ඩිප්ලොමාවත්, ඉන්නදියාවේ අහමද්බාද්හිදී සන්නිවේදනය හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ අසස් අධ්‍යාපනය ලබා ඇත.

**රැකියාව:-** සිංහල නවකථා රචනය , තිර රචනය සහ රඟපෑම.

**වෘත්තීය තොරතුරු:-** සයිමන් නවගත්තේගම (1940-2005) සිංහල නවකතාකරුවෙකු කථිකාචාරවරයෙකු මෙන්ම රංගන ශිල්පියෙකු වේ.

**ජීවන තොරතුරු:-**

**1940** සැප්තැම්බර් **15** වන දින නම් ග්‍රාමයේ උපත ලැබූ සයිමන් 'නවගත්තේගම' නවගත්තේගමයන් **කෙටිකතාකරුවකු, නවකතාකරුවකු, නාට්‍ය රචකයකු, අධ්‍යක්‍ෂවරයකු, නිෂ්පාදකවරයකු මතු නොව නළුවකු වශයෙන් ද ප්‍රකට ශ්‍රේෂ්ඨ කලාකරුවෙකි.** වන්නිකරයේ බස් වහර නිර්මාණශීලී ලෙසින් තම ලේඛනයට යොදා ගත් නවගත්තේගමයන් ස්වකීය ප්‍රථම කෙටිකතා සංග්‍රහය වන 'ඔහුගේ කතාව'1961 දී පළ කරනු ලබන්නේ අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයකු ලෙස උගන්නා අවධියේදී ය. බටහිර සාහිත්‍යයේ ප්‍රචලිත ව තිබූ අධි යථාර්ථවාදී රීතිය සිංහල පාඨකයාට හඳුන්වාදීමේ පුරෝගාමියා වන්නේ නවගත්තේගමයන් ය.
ඔහුගේ නම් කෙටිකතා සංග්‍රහය බොහෝ විචාරකයන් 'සාගර ජලය මදි හැඬුවා ඔබ සන්දා' හැඳින්වූයේපශ්චාත් නූතනවාදී සංකල්පයේ මූලික ම අවස්ථාවක් ලෙසයි.

- ❖ **නවගත්තේගමගේ නාට්‍ය නිර්මාණ ආරම්භය,**


  හැටේ දශකයේදී වේදිකාවේ පෙරළියක් කළ නාට්‍යකරුවන් තිදෙනෙක් 'ඇස් තුනේ කණ්ඩායම' යනුවෙන් හැඳින්විණිකරුණාරත්න .ඔවුන් නම් ඇස් ., සුමන ආලෝක බණ්ඩාර හා සයිමන් නවගත්තේගමය.

- ❖ **ඔහුගේ සියලුම නාට්‍ය ස්වතන්ත්‍ර නාට්‍ය වේ. එනම්,**
  - *ගංගාවක්, සපත්තු කබලක් සහ මරණයක් (1970) රචනය*
  - *ගගන සරණ කුරුල්ලනෝ (1971) -රචනය සහ අධ්‍යක්ෂණය*

* *පුස්ලෝඩං ((1973) රචනය සහ අධ්‍යක්ෂණය*
* ***සුභ සහ යස (1974) රචනය සහ අධ්‍යක්ෂණය***
* *සුදු සහ කළු (1978) රචනය සහ අධ්‍යක්ෂණය*
* *පණ්ඩුකාභය (1982) රචනය සහ අධ්‍යක්ෂණය*

***සුභ සහ යස (1974) රචනය සහ අධ්‍යක්ෂණය***

**https://youtu.be/KJRmdTra6MQ**




ඔහු විසින් නිර්මාණය කරන ලද සුභ සහ යස නාට්‍ය කෘතිය ලංකාවේ බිහි වූ විශිෂ්ට නාට්‍යයක් වන අතර අතිශයින් ම ජනප්‍රිය ද වී ඇත. මහා වංශයේ එන කතා පුවතකින් සමකාලීන සමාජ දේශපාලනය විවරණය කරන කෘතියක් වේ. එහි යසගේ චරිතය රඟපාන ලද්දේ සයිමන් නවගත්තේගම ය.

### ❖ නවගත්තේගමගේ නාට්‍ය ජීවිතය

සයිමන් මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ශෛලිගත නාට්‍ය හා සුගතපාල ද සිල්වා ප්‍රමුඛ 'අපේ කට්ටියේ' ස්වභාවික සංවාද යන නාට්‍ය කලා සම්ප්‍රදායන් දෙකෙන්ම එකසේ පෝෂණය වූවෙකි. .සරත්චන්ද්‍රයන්ගේ සිංහබාහු නිෂ්පාදනය කළ අවධියේ සයිමන් සිටියේ පේරාදෙණි විශ්ව විද්‍යාලයේය ..ඔහු එම නාට්‍යයය මුල සිට අග දක්වාම විචාර පූර්වකව දැකබලා ගත්තේය ..ඉන්පසු ඔහු කොළඹ විශ්ව විද්‍යාලයට එක් වූ පසු 'අපේ කට්ටියේ' නාට්‍යවල නිෂ්පාදන අත්හදා බැලීම් හැදෑරීමට ද අවස්ථාවක් ලද්දේය ..

පසු කලෙක සයිමන් තමාගේම .'සුබ සහ යස' නාට්යයේ යසලාලක තිස්ස රජුගේ චරිතය රඟපෑවේය .එය සිංහල වේදිකාවේ අප දුටු අති විශිෂ්ට චරිතාංග නිරූපණ අතරින් එකකි . සයිමන් තමාගේම'පුස්ලෝඩං', 'ස්ත්‍රී' යන නාට්‍යවල ද රඟපා ඇත.

### ❖ ඔහුගේ ප්‍රබන්ධ කෘති:-

* ඔහුගේ කථාව,
* සාගර ජලය මදි හැඬුවා ඔබ සන්දා (කෙටි කථා එකතුව)
* සාහිත්‍යය, සමාජවාදය සහ කලා විචාරය

- සුද්දිලාගේ කථාව
- සංසාර ආරණ්‍යයේ දඩයක්කාරය
- සංසාර ආරණ්‍යයේ උරුමක්කාරයා
- සංසාර ආරණ්‍යය අසබඩ
- දඩයක්කාරයාගේ කතාව
- සාංකාව
- සාපේෂණී
- ක්ෂීර සාගරය කැලඹිණ
- ස්වර්ණවන්නියේ වල්ලි අම්මලා
- වානරයා
- හිමාලකන්ද තරණය කල අර්ජුන කුමාරයාගේ කතාව
- බාවනාව

ඔහු ප්‍රකට කෙටිකතා සහ නවකතාකරුවෙකු වන අතර චිත්‍රපට නළුවෙකු වශයෙන් ද ප්‍රසිද්ධ ය. කෙසේ හෝ මොහු රාජ්‍ය සාහිත්‍ය සම්මාන , සරසවි සම්මාන ආදි සම්මාන රැසකින් පුද ලද සයිමන් නවගත්තේගමයන් මෙරට පහළ වූ දුර්ලභ පරිකල්පනයකින් හා නිර්මාණ කුසලතාවකින් හෙබි අපූර්ව නිර්මාණකරුවෙකි.

link:- https://youtu.be/KJRmdTra6MQ